නිරිතදිග වලිකාමම් ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 25 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 02 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 15 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරිම් අනුව නිරිතදිග වලිකාමම් ප්‍රදේශිය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට නිරිතදිග වලිකාමම් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

වත්කම් සහ වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. |
| අඩුවෙන් දැක්වීම් | 02 | 28,867,616 | - | 17,959,448 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 10,183 | 02 | 8,370 |
| අත්හැරීම් | - | - | 01 | - |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.16,869,891 ක් වූ ගනුදෙනු 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.22,416,902 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.8,638,312 ක් විය.

2.2 මූල්‍ය පාලනය

------------------

අයවැය ඇස්තමේන්තු නිසි ලෙස පිළියෙල කර නොතිබූ අතර එම හේතුවෙන් තථ්‍ය ආදායම් සහ අයවැයගත ආදායම් අතර රු.4,211,771 ක වෙනසක් ද අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු. 9,070,380 ක වෙනසක් ද නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

## 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 3,307 | 1,383 | 3,485 |
| බදුකුලී | 5,083 | 6,514 | 193 |
| බලපත්‍ර ගාස්තු | 1,844 | 2,352 | 49 |
| වෙනත් ආදායම් | 60,561 | 56,336 | 18,394 |

## 2.3.2 ආදායම් කළමනාකරණය

රු.3,551,852 ක් වූ ආදායම් ණයගැති මුදල සම්බන්ධයෙන් ඵලදායි පියවර ගෙන නොතිබුණි. ඉහත සඳහන් මුදලෙහි වර්ෂ 10 ක කාලපරිච්ඡේදයක් ඉක්ම වූ බදුකුලී සහ වෙළඳ බලපත්‍ර ආදායම් රු.176,747 ක් ඇතුළත් වී තිබුණි.

## 2.3.3 ආදායම් අහිමි වීම

1999 වර්ෂයේ සිට විදුලිබලය සැපයීමට අදාල කටයුතු ලංකා විදුලිබල මණ්ඩලයට භාර දී තිබුණු අතර ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී නොතිබුණි. එමනිසා විදුලිබල නඩත්තු කටයුතු සඳහා සභා අරමුදලෙන් කරන ලද රු.1,057,455 ක් වූ ගෙවීම් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර නොතිබුණි. එබැවින් විදුලිබල නඩත්තු වියදම් සභාවට එහි ආදායමට එරෙහිව අයකිරීමට සිදු වී තිබුණි.

2.3.4 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

-------------------------------------

(අ) උසාවි දඩ

---------------

2012 ඔක්තෝබර් සිට විවිධ අණපනත් යටතේ ගෙවන ලද රු.170,500 ක් වූ දඩ අයකර ගැනිමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) මුද්දර ගාස්තු

------------------

(i.) 2011 සහ 2012 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු පිළිබඳ ලැයිස්තුවක් ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලබාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(ii.) 2006 සහ 2010 දක්වා කාලපරිච්ඡේදය සඳහා අයවිය යුතු මුද්දර ගාස්තු රු.17,788,948 ක් අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

-----------------------------------

2.4.1 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

----------------------------------------------------------

(අ) රු.340,050 ක් වටිනා පහත සඳහන් විෂයයන් 21 ක් 2001 වර්ෂයේ සිට ගබඩාවේ නිෂ්ක්‍රියව තිබුණි.

| විෂයය | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| ස්ප්‍රේයර්ස් | 02 | 19,800 |
| ෂයර්ස් (පිහි) | 19 | 14,250 |
| | --------- | -------------- |
| එකතුව | 21 | 34,050 |
| | ====== | ========= |

(ආ) සමික්ෂණ මණ්ඩල වාර්තා අනුව සභාවේ අරමුදල් මගින් මිලදී ගත් සහ පරිත්‍යාග වශයෙන් ලද භාණ්ඩ විෂයයන් 92 ක් උපයෝජනය නොකොට ගබඩාවේ තබා තිබුණි.

2.4.2 අයකරගත යුතු කාර්ය මණ්ඩල ණය

-------------------------------------------

සභාවේ නිලධාරින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.66,806 ක් ඔවුන්ගේ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකරගෙන නොතිබුණු අතර වර්ෂ 3 කට අධික කාලයක් අඛණ්ඩව ඔවුන්ගේ ගිණුම්වල දක්වා තිබුණි.

2.4.3 සමික්ෂණය නොකළ වත්කම්

------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ වත්කම් භෞතික සමික්ෂණ වාර්තා මගින් තහවුරු කර නොතිබුණු අතර පහත දැක්වෙන පරිදි වටිනාකම පොත් අගය මත රු.49,965,926 ක් ලෙස දක්වා තිබුණි.

| විෂයය | වටිනාකම |
|---|---|
| ස්ථාවර වත්කම් | 48,617,892 |
| ගබඩා විෂයයන් | 1,348,034 |
| | ---------------- |
| | 49,965,926 |
| | =========== |

2.5 අනුකූල නොවීම්

-----------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ ආදායට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ---------------------------------- | | ------------------ |
| (අ) | ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන) රීති - 1989 | | |
| | (i) III පරිච්ඡේදයේ 33 වගන්තිය | - | බදු පැහැර හැරි අයගේ ලැයිස්තුවක් සෑම කාර්තුවක් අවසානයේදිම සභාපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (ii) III පරිච්ඡේදයේ 76 වගන්තිය | - | බදුකුලි රු.193,757 ක් අයකර ගැනිම ප්‍රමාද වීම පිළිබඳව ආදායම් ලිපිකරු විසින් ලේකම්වරයා/සභාපති වෙත දන්වා නොතිබුණි. |
| | (iii) III පරිදච්ඡේදයේ 81 වගන්තිය | - | ඉඩම් ගනුදෙනු මත ප්‍රතිපූර්ණය කළයුතු මුද්දර ගාස්තු සහ දඩ සම්බන්ධව සෑම කාර්තුවකදීම කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | - | වර්ෂ 02 ක් ඉක්මවූ රු.15,076 ක් වූ විවිධ තැන්පතු ආදායමට බැරකර නොතිබුණි. |
| (ඇ) | උතුරු පළාත් මුදල් රීති අංක 101 සහ 102 | - | අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2006 අංක 10 දරන දේශිය ආදායම් පණත | - | අයකරගත් රඳවුම් බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඉ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පණත | - | 2011 සහ 2012 වර්ෂයන්හිදි අයකරගත් රු.2,872,670 ක් වූ එකතු කළ අගය මත බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඊ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පණත | - | සමාලෝචිත වර්ෂය තුල අයකර ගන්නා ලද රු.37,977 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

(අ) 2010 සහ 2011 වර්ෂයන්ට අදාල රැඳවුම් මුදල් රු.171,174 ක් කොන්ත්‍රාත්කරුවන්ට නොගෙවා තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි.

(ආ) 2009 සහ 2010 වර්ෂයන් තුල ප්‍රජා මධ්‍යස්ථාන සඳහා පරිත්‍යාග වශයෙන් ලද රු.115,660 ක් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වුවද ඉහත සඳහන් පරිත්‍යාග මෙම වාර්තාවේ දිනය දක්වාම අදාල ප්‍රජා මධ්‍යස්ථාන වලට ලබා දී නොතිබුණි.

(ඇ) 2000 වර්ෂය සඳහා වූ කොන්ත්‍රාත්කරුවන්ගේ තැන්පතු රු.10,000 ක් ආපසු ගෙවා නොතිබුණි.

(ඈ) 2011 සහ 2012 වර්ෂයන්හිදි විවිධ කාර්යයන් සඳහා වෙන් කරන ලද රු. 234,515 ක් අදාල පාර්ශවයන් වෙත ගෙවා නොතිබුණි.

| වර්ෂය | කාර්යයන් | මුදල |
|---|---|---|
| 2011 | තිර රෙදි දැමීම - මානිපේ | 6,250 |
| 2011 | නිල ඇඳුම් | 8,120 |
| 2012 | ට්‍රාන්ස්ෆෝමර් - මානිපේ | 49,900 |
| 2012 | වීථි ආලෝක කිරිම | 41,445 |
| 2012 | මාර්ග වල බොරළු ඇතිරීම | 32,000 |
| 2012 | නිල ඇඳුම් | 96,800 |
| | | -------------- |
| | | 234,515 |
| | | ======= |

(ඉ) රු.1,691 ක් වූ විශ්‍රාම වැටුප් දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකොට මෙම වාර්තාවේ දිනය දක්වා තැන්පතු ගිණුමෙහි තබාගෙන තිබුණි.

(ඊ) 2011 ජුනි සිට නොවැම්බර් දක්වා නොගෙවූ වැටුප් රු.87,064 ක් අදාල නිලධාරින්ට නොගෙවා තැන්පත් ගිණුමෙහි රඳවා ගෙන තිබුණි.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------------

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය

---------------------------------------------

වාර්ෂික අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල නොකිරිමේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධන වැඩ 15 ක් සඳහා වෙන් කරන ලද රු.6,424,876 ක් වූ සංවර්ධන අරමුදල් අපේක්ෂිත කාර්යයන් සඳහා යොදවා ගෙන නොතිබුණි. එබැවින් අනාගතයේදි මෙම මුදල් උපයෝජනය කිරිමේ අපේක්ෂාවෙන් විවිධ ණයහිමි ගිණුමෙහි රඳවාගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘති විස්තරය | විවිධ ණයහිමියන් යටතේ වෙන්කළ මුදල් |
|---|---|
| | රු. |
| මාර්ග පුනරුත්ථාපනය (NELSHIP) | 355,922 |
| ෂන්ගනායි රෝහල් පාර | 185,000 |
| ඉරක්කුමවත්ත පාර | 450,880 |
| කඩපුලම් මතකාල් මහාළුම් අංශය | 442,500 |
| මානිපේ නගර ට්‍රැක්ටර් ටේලර් | 325,000 |
| අනතා පාර පුනරුත්ථාපනය | 234,214 |
| මාරිසන් වෙරළ පාර පුනරුත්ථාපනය | 940,373 |
| නවාලි පිරශන් වෙළඳපොල අළුත්වැඩියාව | 200,000 |
| මහියාපිට්ටි වෙළඳපොල අළුත්වැඩියාව | 100,000 |
| කඩප්පුලම් තාප්පය පුනරුත්ථාපනය | 223,940 |
| වඩලියඩාඉප්පු අපවහන පද්ධතිය | 2,500,000 |
| උන්දුදුෂාන්දි පාර පුනරුත්ථාපනය | 32,047 |
| රාජා මුරුන්කයියඩි මාර්ගය බොරළු ඇතිරීම | 140,000 |
| කොත්තුකඩ්ඩි මාර්ගය බොරළු ඇතිරීම | 245,000 |
| කකයිතිවු මාර්ගය බොරළු ඇතිරිම | 50,000 |
| | 6,424,876 |

(ආ) සම්පූර්ණයෙන් අත්හැර දැමූ ව්‍යාපෘති

-----------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල ඉටු කිරිමට සැලසුම් කළ මාර්ග සහ ඇලමාර්ග අළුත්වැඩියාවට අදාළ වටිනාකම රු.14,319,000 වූ ව්‍යාපෘති 21 ක් වර්ෂය තුලදී සම්පූර්ණ නොකොට අත්හැර දමා තිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

-----------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i.) ආදායම් රැස්කිරිම

(ii.) ස්ථාවර වත්කම්

(iii.) පරිත්‍යාග

(iv.) විවිධ තැන්පතු

(v.) අයවැය පාලනය

(vi.) ගිණුම්කරණය